

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**



| | | |
|---|---|---|
| **55 වන කාණ්ඩය** | **බු.ව.2556 උඳුවප් මස පුරපසළොස්වකදා ක්‍රි.ව.2012 දෙසැම්බර් මස 27 වන දා** | **08 වන කලඹ** |



# දිගාසී ගුරු දෙවිඳ !

උදා හිරු කිරණ සේ
සිවු දිග ම එළිය කළ
සුසුදු අරවින්දයකි
සසුන් විල සුවඳ කළ
දිලෙන බෝ පතක් සේ
සැම ගෙ සිත් පහන් කළ
සසුන් නුබ ගැබ උදුළ
සුපුන් සඳ සමිඳ ඔබ !

**- මුදිතමනෝ හිමි**





# අපේ අම්පිටියේ ලොකු හාමුදුරුවෝ

"යො හොති ව්‍යත්තො ච විසාරදො ච
බහුස්සුතො ධම්මධරො ච හොති
ධම්මස්ස හොති අනුධම්මචාරී
ස තාදිසො වුච්චති සංඝසොභනො"

යම් භික්ෂුවක් ව්‍යක්ත වේ ද, විශාරද වේ ද, බහුශ්‍රැත වේ ද, ධර්මධර වේ ද, ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි යෙදුණේ ද, එ බඳු භික්ෂුව "සංඝසොභන" යැයි කියනු ලැබේ.

මහරගම සිරි වජිරඤාණ ධර්මයතනාධිපති, ශ්‍රී ධර්මරක්ෂිත වංශාලංකාර උපාධ්‍යාය අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුළ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ එකී සංඝශෝභන ගුණවලින් පිරිපුන් සංඝපිතෘන් වහන්සේ නමකි. උන් වහන්සේ උපතින් 99 වන වියට පා තැබුවේ මෙම දෙසැම්බර මස 24 වන දා ය.

අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුළ නායක මාහිමිපාණන් වහන්සේ ගේ චරිතය හා සේවාව මෙතෙක්

උත්සවාකාරයෙන් ප්‍රකට සම්භාවනයකට ලක් නො වුව ද නූතන සංඝ සමාජයේ උන් වහන්සේ උත්කර්ෂණීය සම්භාවනයට ලක් කළ යුතු උත්තම ගණයේ චරිතයකි. ලක්දිව නූතන ශාසන ඉතිහාසයේ අද්විතීය පරිච්ඡේදයක් අලංකරණය කළ පරමපූජනීය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ පැවිදි ශිෂ්‍යවරයන් අතර වැඩ සිටි අතිපූජ්‍ය නාරද මාහිමියන් වහන්සේ, අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමියන් වහන්සේ, අතිගරු පියදස්සි නාහිමිපාණන් වහන්සේ බඳු, දේශීය වශයෙනුත් අන්තර්ජාතික වශයෙනුත් විශිෂ්ට සේවාවන් සිදු කළ මාහිමියන් වහන්සේලා අතර, එක් කරුණකින්, ඒ හැම ශිෂ්‍ය යතිවරයන් වහන්සේලාට වඩා විශිෂ්ට මෙහෙවරක් සිදු කැර ඇත්තේ අම්පිටියේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. එය නම් සම්බුද්ධ ශාසනය අනාගතයටත් සුරක්ෂිත ව පැවැතෙන අයුරින් තව ද ශිෂ්‍ය පරපුරක් සංඝ සමාජයට බිහි කිරීම ය. ඒ කාර්යයට අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමියන් වහන්සේ ද සම්මාදම් වූහ. එහෙත් එහි නියන්තෘන් වහන්සේ අම්පිටියේ ලොකු හාමුදුරුවෝ ය.

බුද්ධශාසනයක් පැවැත්මට ධර්මය ම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒ දහම අනුගමනය කරන, ධර්මය පිළිබඳ ආදර්ශ දානය කරන භික්ෂු පිරිසක් ද ඊට අත්‍යවශ්‍ය ය. කසා වත නැත්නම් ශාසනයක් ද නැත. කසා වත බැබැළෙනුයේ කසා වෙසින් නොව සසුන් පිළිවෙත් පුරන පැවිද්දන් ගෙන් ම ය. මෙය ඉතා

හොඳින් දූරදර්ශී ව වටහාගත් පැවිදි උතුමාණ කෙනෙකි අපේ අම්පිටියේ ලොකු හාමුදුරුවෝ.

## පින්වත් කුමරකු ගේ උපත

මහනුවර පුරවරයට ආසන්න ගම් පියෙසක් වූ ''අම්පිටිය'' අප කථානායකයන් වහන්සේ ගේ ජාත භූමිය යි. එහි විසූ සයිමන් රාජපක්ෂ පියාණනට දාව, රාජපක්ෂ මාතාව ගේ කුසින් 1914 දෙසැම්බර් 24 දා රාත්‍රී 10.00 ට පින් පිඬක් බඳු ව, හරියට ම කිතුනුවන් ගේ නත්තල සමරන්නට පැය 2 කට පෙර උපන් පියකරු දරුවා නමින් ''ධර්මදාස'' නම් වී ය. භක්තිමත් බෞද්ධයකු වූ පියතුමා නත්තල් උදාවට ආසන්න ව ධර්මදාස බිලිඳා උපන් බැවින් ඔහු හොඳ බෞද්ධයකු නො වෙති යි සැක පහළ කළ ද එය හුදු සැකයෙක් ම විය.

ධර්මදාස ළදරුවා මූලික අධ්‍යාපනය ලැබුවේ නිවසට ළං ව පිහිටි සාන්ත මේරි කතෝලික පාසලිනි. බුද්ධ ධර්මය ඉගෙන ගත්තේ දළුක්ගොල්ලේ රාජමහා විහාරයේ දහම් පාසලිනි. දෙමාපිය හෙවණේ මනා ආගමික හැඩගැස්මක් ලද පුංචි ධර්මදාස වයස අවුරුදු දොළහේ සිට මාංසාහාරයෙන් සම්පූර්ණයෙන් ම වැළකුණේ ය.

සහෝදරයන් අට දෙනකු ද, සහෝදරියන් තිදෙනකු ද යුත් පවුලේ පිරිමි බාලයා වූ ධර්මදාස, තරුණ වියට එළැඹෙන සමයේ වුව ද සිය ආගමික වත් පිළිවෙත්

අඩුවක් නො කර පුරුදු කෙළේ ය. අධ්‍යාපන කටයුතු අවසන් කොට සිටි තරුණ ධර්මදාසට නාවලපිටියේ නගර සභාවෙහි රැකියා පත්වීමක් ලැබිණි. සසරින් ගෙනා කිසියම් වාසනා ගුණයකට පුරුදු කම් ලද මේ තරුණයාට මාස දෙකකින් ම රැකියාව එපා විය. ඊට හේතුව වූයේ හරකුන් මැරීමට නගර සභාවෙන් ලබා දෙන අවසරයට තමා ද වක්‍ර ලෙස සම්මාදම්කරුවෙක් වන්නේ යැයි සිතුණු නිසා ය. එතැනින් ඉවත් වූ හෙතෙමේ සිය සොහොයුරකු විදුහල්පති ධුරය දැරූ පාසලක ඉංග්‍රීසි උප ගුරුවරයකු ලෙස පත් වීම ලැබී ය. ඉතා ඉක්මනින් හේ ඊට ද ''ආයුබෝවන්'' කිවේ ය.

වයස මුහුකුරා යත් ම, ගිහි දිවියේ ඇති නිසරු කම් හා දුක් කම්කටොළු මැනැවින් අවබෝධ කැරගත් ධර්මදාස තරුණයාට දිනෙන් දින ම සසරින් එතෙර වීම පිළිබඳ අදිටන් ඇති වූයේ පුරා කෘත පුණ්‍ය මහිමය නිසා ම ය. ඔහු ඒ බව මවුපියන් ඇතුළු පවුලේ හැමටත්, වෙසෙසින් ම ළෙන්ගතු සොහොයුරාණන් ව සිටි එවක කොළඹ සේවය කළ මේජර් ජේ.යූ. රාජපක්ෂ මහතාටත් දන්වා සිටිය ද ඔවුන්ගෙන් ඊට රුකුලක් නො ලැබිණි.

සිය ගමන් මගේ කිසියම් සන්ධිස්ථානයකට පැමිණ සිටි ධර්මදාස රාජපක්ෂයනට එවක බම්බලපිටියේ වජිරාරාමාධිපති ව වැඩ විසූ පරමපූජ්‍ය පැළෑණේ සිරි වජිරඥාණ මහානායක මාහිමිපාණන් වහන්සේ ගේ ගුවන් විදුලි ධර්මදේශනා නිතර නිතර අසන්නටත්, උන් වහන්සේ ලියූ ලිපි ලේඛන පුවත්පත් සඟරා මඟින් නිතර නිතර කියවන්නටත් අවස්ථාව ලැබිණි. එයින් ම ඇති වූ

ආකර්ෂණයත් බලවත් පැහැදීමත් නිසා සිය ලොවුතුරු අදිටන මුදුන් පත් කැර ගැන්ම උන් වහන්සේ ගේ සිහිලැල් සෙවණින් සලසාගත හැකි යැයි විශ්වාසයක් සිත තුළ පැළපැදියම් වන්නට විය.

එකල සොයුරු ජේ.යූ. රාජපක්ෂ මහතා නවාතැන් ගෙන සිටියේ ගල්කිස්සේ ය. තරුණ ධර්මදාසයන් ද අයියා ළඟ නතර ව නිතර නිතර වජිරාරාමයට යන්නට එන්නට මඟ පාදා ගත්තේ ය. මාස තුනක් ම අටසිල් සමාදන් ව දිනපතා සවස ගල්කිස්සේ සිට වජිරාරාමයට ගොස් අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේ ගේ පා සෙවණෙහි බණ දහම් උගත් තරුණ ධර්මදාස උවසුවාණන් පැවිදි වීමේ තිරසර අදිටනින් දස සිල් සමාදන් ව පන්සලෙහි ම නතර විය.

## පැවිදි උපසම්පදාව

සැදැහැති පහන් ගුණයෙන් පිරිපුන් ධර්මදාසයන් ගේ පැවිදි වීමේ අවංක අභිලාෂය මැනැවින් තේරුම් ගත් පරමපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමියන් වහන්සේ උන් වහන්සේ ගේ ගුරුදේවයන් වූ කඹුරුගමුවේ දේවගිරි විහාරාධිපති ව වැඩ විසූ සිරි සද්ධම්ම ජොතිපාල කවිධජ විනායාචරිය වේරගම්පිට සිරි රේවත මාහිමියන් වහන්සේ උපාධ්‍යාය තනතුරේ තබා තරුණ ධර්මදාසයන් 'අම්පිටියේ රාහුල'' යන නමින් පැවිදි කරවූ සේක. ඒ 1936 මැයි 6 වන දා ය.

භද්‍ර යෞවනයෙහි දී පැවිදි බිමට පා තැබූ රාහුල හිමියෝ ඇවැසි විනය බණ දහම් මැනැවින් ප්‍රගුණ

කැරගෙන සිටි බැවින් 1936 වසරෙහි දීම ජූලි 30 වන දා කැලණි නදී උදකුක්ඛෙප සීමා මාලකයෙහි දී උපසම්පදා භූමියට ඇතුළත් කැරගනු ලැබූහ. ඒ තවත් චීන සාමණේර හිමිවරුන් පස් දෙනකු සමඟිනි. රාහුල තරුණ සාමණේර හිමියනට කර්මවාගාචාර්යවරුන් වුවාහු පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් වහන්සේත් තල්අරඹේ ශ්‍රී ඉන්දසාර මාහිමිපාණන් වහන්සේත් අහංගම පණ්ඩිත ශ්‍රී ප්‍රඥාලෝක මාහිමිපාණන් වහන්සේත් ය.

## වජිරාරාම ගුරු භූමිය

පැළෑණේ මහානායක මාහිමිපාණන් වහන්සේ ගේ පා සෙවණෙහි හැදෙන වැඩෙන කෙනෙකුට බැහැරින් ශාස්ත්‍ර පීඨ, පිරිවෙන් අධ්‍යාපනය අවශ්‍ය වූයේ නැත. උන් වහන්සේ මහා ධර්ම භාණ්ඩාගාරයෙකි. ධර්ම ශාස්ත්‍රාලයයෙකි. භාෂා කෝෂ්ඨාගාරයෙකි. ධර්ම - විනය පිළිබඳ ප්‍රායෝගික අභ්‍යාස ආරාමයෙකි. නාරද මාහිමි, මඩිහේ මාහිමි, පියදස්සි නාහිමි, ඤාණමෝලි හිමි, සෝම - ඛේමින්ද හිමිවරු ආදි දෙස් විදෙස් පැවිදි උතුමන් මනා ශාස්ත්‍රීය හා ධර්මවිනයානුකූල ශික්ෂණයක් ලැබුවේ විදුරුනැණ මාහිමි විදු හෙවණෙහි ය. උන් වහන්සේලා කීර්තිමත් සම්භාව්‍ය ලෝක-ශාසනික සේවාවන් සිදු කෙළේ ඒ පසුබිම ද පදනම් කැරගෙන ය. අම්පිටියේ රාහුල හිමියනට ද ඒ ගුරු ආභාසය නොමඳ ව වෙසෙසින් ලැබිණි.

## ගුරු භක්තිය

අම්පිටියේ ලොකු හාමුදුරුවන් වහන්සේ නිතර සිහිපත් කළ එක් කරුණක් වූයේ උත්තම ගුරුදේව කෙනෙකුන් ගේ සෙවණෙහි හැදෙන්නට ලැබීම පිළිබඳ වාසනාව යි. '' අනේ ඔය නමලාටත් පැළෑණේ මහානායක හාමුදුරුවන් දකින්නට වත් ලැබුණා නම් ....'' යන්න උන් වහන්සේ බොහෝ වර අපට කියූ කියමනකි. ලොකු සමිඳුන් ගේ 70 වන උපන් දිනය නිමිත්තෙන් පළ කැරුණු ''සම්භාවනා'' කෘතියෙන් පහත සඳහන් ඡේද තුන උපුටා දක්වනු කැමැත්තෙමි.

''........ අම්පිටියේ ලොකු හාමුදුරුවෝ යට කී විනයෙන් හික්මුණු උද්දීප්තිමත් අනුජාත ශිෂ්‍ය රත්නයෙකැයි නො පැකිළ ව කිව යුතු ය. උන් වහන්සේ තුළ තම ගුරු දේවයාණන් කෙරෙහි ඇත්තේ අනුපම භක්ත්‍යාදරයෙකි. පැළෑණේ මාහිමියන් රෝගාතුර වූ අවසාන කාල පරිච්ඡේදයෙහි දොළොස් වසක් පමණ උන් වහන්සේ සමීපයෙහි සිටිමින් හිස කෙහෙ කැපීම්, නිය කැපීම්, සිවුරු සේදීම්, හිස තෙල් ගෑම්, පා මිරිකීම් ආදි කුඩු මහත් වතාවත් සිදු කළෝ උන් වහන්සේ ය. (අනෙක් බොහෝ ශිෂ්‍ය හිමිවරු එකල ඇදුරු නියමයෙන් ශාඛා ස්ථාන භාරව ගියෝ ය.)

''බොහෝ දිනවල පැළෑණේ මහානායක මාහිමියන් රෝග ග්‍රස්ත ව දුබල ව සිටි හෙයින් ඇඳෙහි හාන්සි වී අටුවා ටීකා ආදි පොත් කියවා ගත්තේ ශිෂ්‍යයන් ලවා ය. මේ රාජකාරිය බොහෝ විට පැවැරුණේ එකල

තරුණ වියේ සිටි අම්පිටියේ මාහිමිපාණන් වහන්සේ ට ය. සමහර දවස්වල මේ ගුරු වතාවත රෑ දොළහ, එක වන තුරු ඉටු කරන්නේ ගිලන්පසක් වත් නො වළඳා ය. මේ ලෙසින් බැතිබර ව කටයුතු කිරීම නිසා ඉතා උසස් අයුරින් සිය ගුරු දේවයන් ගේ චිත්තාරාධනය කිරීමට උන් වහන්සේ සතතයෙන් ම සමත් වූහ. මේ සම්බන්ධයෙන් පැළෑණේ මාහිමියන් විසින් ම ලියන ලද සටහනක් මෙහිලා සඳහන් කිරීම බෙහෙවින් ම වැදගත් වන්නේ ය.

''...... 'බෞද්ධ ළමයා' ගේ වැඩත් ඉරිදා දහම් පාසලේ ඉංගිරිසි පන්තිවල වැඩත් දන් පිරිත් ආදිය භාරගෙන දායකයන් හා ඒ සඳහා පිටින් පැමිණෙන සංඝයාත් සතුටු වැඩෙන සේ මෙහෙ කිරීමත් දූන් පිරිමැසිය නොහැකි තරමට අමාරු ය. එයින් 'බෞද්ධ ළමයා' ගේ වැඩ සම්පූර්ණයෙන් ම වාගේත් ඉරිදා පාසලේ කටයුතු රැසකුත් මගේ සුව දුක් බැලීම් ආදියත් රාහුළ කෙරෙයි. ඒ නමට හුස්ම ගන්නත් නිවාඩු නැති තරම යි.'' (1952 සැප්ඃ 29 දා නුවරඑළියේ අශෝකාරාමයේ ඌරුගමුවේ සේනානන්ද සිසු හිමියන් වෙත යවන ලද ලිපියකිනි)

## ගුරුදේවයන් ගේ අපවත් වීම

1955 සැප්තැම්බර 21 දින සද්ධර්මාභිලාෂී ශාසන මාමක දෙස් - විදෙස් සියලු ජනතාව ගේ සිත් සතන් තුළ මහත් ශෝක වලාවක් පැතිර ගිය දවසකි. ඒ එදින පරමපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් වහන්සේ ගේ අපවත් වීම සිදු වූ බැවිනි.

මහ රහත් සැරියුත් මාහිමියන් වහන්සේ පිරිනිවන් පෑමෙන් අනඳ මාහිමියනට ඇති වූ 'සියලු දිශාවෝ අඳුරු වූවා සේ පෙනෙත්' වැනි අදහසක් එකතින් ම සිය ගුරු හිමියන් අපවත් වීමෙන් රාහුළ හිමියනට ද පහළ වන්නට ඇත.

## නව ධර්මායතනයක උදාව

පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් වහන්සේ සිය දිවියේ අවසන් සමයේ 'අනේ තව ගෝලයන් පනහක් වත් මේ සසුනට හදා තියන්නට පුළුවන් වුණා නම්....' යන්න කිහිප වරක් සඳහන් කළ අදහසකි. මේ සිතිවිල්ල ගැඹුරින් සිතට ගත් ශ්‍රේෂ්ඨ අනුජාත ශිෂ්‍යවරයන් දෙනමක් වූ අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමියන් වහන්සේත් අතිගරු අම්පිටියේ ශ්‍රී රාහුළ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත් ස්වකීය ආචාර්යෝත්තමයන් වහන්සේ පිදීමේ උත්තරීතර කාර්යය ලෙසත් ඒ පිළිබඳ නූතන ශාසනික අවශ්‍යතාවත් සලකා භික්ෂූන් පුහුණු කරන ආයතනයක් ඉදි කිරීමේ කාර්යයෙහි ප්‍රෝත්සාහී වූහ. මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය වූ කලී එහි මස්තක ප්‍රාප්තිය යි.

ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්ම ප්‍රතිපන්න යන සගුණයෙන් පිරිපුන්, නූතන භාෂා ඥානයෙන් ද සමන්විත සඟ පරපුරක් බිහි කිරීමේ මේ උදාර ශාසන කාර්යය 1958 අප්‍රේල් 21 වන දා ආරම්භ කරන ලදී. ඒ සඳහා අනුග්‍රාහක සංගමයක් ලෙස ඩී. එල්. එෆ්. පේද්‍රිස් මැතිතුමා ගේ ආරම්භක

සභාපතිත්වයෙන් 'සාසන සේවක සමිතිය' නමින් දායක සභාවක් ද පිහිටුවා ගන්නා ලදී.

අතිපූජ්‍ය මහානායක මාහිමියන් වහන්සේත් අතිගරු අම්පිටියේ ලොකු හාමුදුරුවන් වහන්සේත් සසරින් ම ප්‍රාර්ථනා කැරගෙන ආ සම්භක්ත පැවිදි සහෝදර යුග්මයෙකි. උන්වහන්සේලා දෙනම ගේ ම ශාසනිකත්වය පිළිබඳ අදහස් එක සමාන විය. දෙදෙනා වහන්සේ ගේ ම සත්පුරුෂ පරමාර්ථ එක සමාන විය. දෙදෙනා වහන්සේ ම ගුරු උතුමාණන් ගත් මඟ හරසරින් ගත්, 'පෙන්නීමට නො ව සැබෑවට ම', බොරු තෙද මන් නැති, අපෞද්ගලික චේෂ්ටා ඇති, බෝසතාණන් ලෙස පරාර්ථ සේවයට ම නිරතුරු කැප වුණු දුර්ලභ ගණයේ විශිෂ්ට සඟ පියවරු වූහ. උන් වහන්සේලා ගේ ශාසනික අදහස්වලට සරිලන සත්පුරුෂයන් ගේ එකතුවක් වූ 'සාසන සේවක සමිතිය' උන් වහන්සේලා ගේ සදභිප්‍රායයන් සම්පූර්ණ කැර ලීමට ඉත සිතින් නිරතුරුව බැඳී සිටියේ ය. දැනුදු එසේ බැඳී සිටින්නේ ය. සිරි වජිරඤාණ ධර්මායතනය ඇසුරින් ලෝක-ශාසනික වශයෙන් විශිෂ්ට සේවා සම්ප්‍රදානයක් රටට හිමි වූයේ ඉහත කී ත්‍රිවිධ සමවායයන් ගේ සමඟතාව නිසා ය.

මේ සඵලතා ගමනේ ආරම්භය අතිශයින් ම දුෂ්කර වූවක් විය. මහරගම ධර්මායතන භූමියේ එවක පැවැති චාලි වලව්ව හොල්මන් ගුහාවක් විය. අම්පිටියේ ලොකු හාමුදුරුවන් වහන්සේ වජිරාරාමයෙන් නික්ම ගොස් එහි නතර ව අප්‍රතිහත ධෛර්යයෙන් යුතු ව සැදැහැතියන් එක් රැස් කරවාගෙන දහම් එළියෙන් මුළු පෙදෙසෙහි

ම නව අරුණැල්ලක් ඇති කළෝ ය. අද සැරදුන් හා තරුණ ශීල සමාදාන ශාලාව පවත්නා භූමිය එකල අතුරන ලද තණ පලසක් වැනි එළිමහන් පිටියෙකි. එහි ඉරු දින ධර්ම දේශනා ද, තාවකාලික පොල් අතු මඩුවක ආරම්භ කළ පෝදා සීල සමාදානය ද පළාත්බද මහජනයාට නව ආකර්ෂණයක් ලබාදුන්නේ ය. බණ කියන හාමුදුරුවෝ සතළිස් විය ඉක්මවුව ද පිරිපුන් යෞවන දේහයක් ඇත්තෙකි. උපශාන්ත ගමන් විලාස හා කතා බහ ඇත්තෝ ය. උන්වහන්සේ ගේ කතා විලාසයත්, බණ දෙසන අයුරුත් ලොකු-කුඩා හැම දෙනාගේ සිත් පැහැර ගනී. එය මින් පෙර නො ඇසූ විරූ ප්‍රායෝගික දහමෙකි. ඇතැම් විට උන් වහන්සේ ඇතැම් නාගරික සැදැහැවතුන් සමඟ චතුර ලෙස ඉංග්‍රීසි බස ද වහරති. මේ සියලු කරුණු ම නොපැහැදුණුවන් ගේ පැහැදීම ඇති වීම සඳහාත් පැහැදුණුවන් ගේ පැහැදීම වැඩි දියුණු වීම සඳහාත් බෙහෙවින් බලපෑවේ ය. මේ කාලය තුළ වැඩි වියපත් බවක් නොලද අතිපූජ්‍ය මඩිහේ මහානායක මාහිමියන් වහන්සේ ද වරින් වර වැඩම කරමින් ලොකු හාමුදුරුවනට දුන් පිටුබලය හා අත්වැල අතිශයින් ම මහඟු වූවකි.

ධර්මායතනය තුළ ක්‍රමයෙන් ගොඩනැගිලි ඉදි කිරීම පමණක් නොව ආරාමික පරිසරය ද කෙමෙන් කෙමෙන් වැඩෙන්නට විය. ලොකු හාමුදුරුවෝ ඒ සඳහා අපමණ වෙහෙසක් දැරූහ. පසු කලෙක උන් වහන්සේ ගේ ම උත්සාහයෙන් ආරම්භ කරන ලද අනෙක් ආරණ්‍ය - ආරාම ඉදි කිරීම සඳහා ද උන්

වහන්සේ දැඩි සේ දුක් මහන්සි වූහ. අද රමණීය ආරාම තත්ත්වයට පත් ව තිබෙන මහනුවර බෝවලවත්ත වජිරාරාම ආරණ්‍ය සේනාසනයත්, මහනුවර ප්‍රිම්රෝස් උයන වජිරාරාමයත්, කෙන්ගල්ල අඹකොටේ දැන් ව්‍යවහාර වන සිරි සුගත තපෝ වන විහාරයත්, මහඔය, උණුවතුර බුබුළ වෙහෙරගල අරණ්‍ය සේනාසනයත්, පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය විහාරයත්, මිහින්තලේ කටුපොතකන්ද වජිරාරාම අරණ්‍යයත් අද පවත්නා තත්ත්වයට පත් කිරීමට ලොකු හාමුදුරුවෝ අප්‍රමාණ ලෙස දුක් වෙහෙස දරුවේ දුක්ඛසෙය්‍යා දුර්භෝජන ලබමිනි. ඒ හැම ශාසන කාර්යයක් ම උන් වහන්සේ සිදු කෙළේ භික්ෂූන් වහන්සේලාට තම සසුන් පිළිවෙත් සරු දිවියක් ගත කිරීමට සුදුසු ක්ෂේම භූමි සකස් කැර දීමට ය.

## සසුන තුළ මවු-පිය සෙනෙහස

ආචාර්යයන් වහන්සේ විසින් අන්තේවාසික ශිෂ්‍යයනට 'පියකු' යන හැඟීමෙන් ක්‍රියා කළ යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කැර ඇත. ධර්මායතනයේ හැදුණු වැඩුණු සියලු පැවිදි ශිෂ්‍යයෝ එබඳු උත්තම ගණයේ මවුපිය සෙනෙහසක උරුමය ලද්දෝ ය. අතිපූජ්‍ය මහානායක මාහිමියන් වහන්සේ 'පිය' කෙනෙකු මෙන් ද, අතිගරු අම්පිටියේ ලොකු හාමුදුරුවන් වහන්සේ 'මවු' කෙනක මෙන් ද ක්‍රියා කිරීම නිසා දහර සාමණේරයකුට වුව ද තමා සුරක්ෂිත ය යන හැඟීමක් ඇති විය.

මහරගම ධර්මායතනයේ විනය පාලන කටයුතු සිදු කෙළේ ලොකු හාමුදුරුවෝ ය. අධ්‍යාපන කටයුතු කලක් අතිගරු තංගල්ලේ ධීරාලංකාර මාහිමියන් වහන්සේ ද ඊට පසු දිගු කලක් අතිගරු වලස්මුල්ලේ රතනසාර මාහිමියන් වහන්සේ ද සිදු කළහ. නවක සාමණේරයන් සඳහා 'විශේෂ පන්තිය' බාර ව අධ්‍යාපන කටයුතු සිදු කළාහු ලොකු හාමුදුරුවන් වහන්සේ ය.

## විනය ශික්‍ෂණයට මුල් තැන

භික්ෂූන් වහන්සේ හැදීම පිළිබඳ අරමුණ ලොකු හාමුදුරුවන් වහන්සේ නිරතුරු ව ම සිත්හි දරාගෙන සිටියෝ ය. 70 නමකට  ආසන්න නේවාසික සිසු පිරිසක පරිපාලනය එකල ලෙහෙසි පහසු දෙයක් නොවී ය. භික්ෂූන් ගැන සොයා බැලීම විනය හා පරිපාලනය කටයුතු, ආයතනික කටයුතු, දහම් පාසල, දායකදායිකාවන් ගේ දානමාන- බණ පිරිත් පින්කම් පාංශුකූල කටයුතු සියල්ල ම මූලික ව අවධානය යොමු කරමින් පිරිමැසුවේ උන් වහන්සේ ය. අද ඒ සියල්ල ම කරන්නේ උන්වහන්සේ ගේ වැඩිහිටි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා වැඩ බෙදාහදාගෙන ය.

එකල කුඩා අපි දැඩි විනය පාලනයකට යටත් වීමු. වරදට දඬුවම් ද ලැබේ. එකල සාමණේර වරුනට දුන් දඬුවම් වූයේ ගස් සිටවීම ය. වළවල් කැපීම් ආදිය ය. උද්වේගයෙන් කරන දෝෂාරෝපණ, අවවාදත් සමඟ ලොකු හාමුදුරුවන් කෙරෙහි භය සම්ප්‍රයුක්ත ආකල්පයක් අප තුළ ඇති විය. අනුශාසක කෙනෙකුන්

තුළ තිබිය යුතු යහ ගුණ ස්වභාවය බුදුරදුන් වදාළේ මෙ පරිද්දෙනි.

''අත්තානමේව පඨමං - පතිරූපෙ නිවේසයේ
අථඤ්ඤමනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතො''

''තමා ම පළමු ව සුදුසු ආදර්ශයෙහි පිහිටා සිට ඉක්බිති අවවාද අනුශාසනා කරන්න. ඒ ඥානවන්තයා කෙලෙසීමක් නොලබන්නේ ය.''අම්පිටියේ ලොකු හාමුදුරුවෝ එ බඳු ආදර්ශවත් උතුම් අනුශාසකවරයාණ කෙනෙකි. දුලබ ආචාර්යවරයාණ කෙනෙකි. දිනපතා වාගේ උදේ බුද්ධ වන්දනාවෙන් පසු, ඇතැම් විට සවස වන්දනාවෙන් පසු ද අවවාද දීම ලොකු හාමුදුරුවන් වහන්සේ ගේ සිරිතකි. බොහෝ විට එම අවවාද පැයකට ආසන්න කාල සීමාවක් ගනී. ඇතැම් දිනවල අපි කවුරුත් අවවාද අසන්නේ සිට ගෙන ම ය. ඇතැම් දිනවල ලොකු සමිඳුන් සමඟ බිම පත්කඩ එලා වාඩි වී අවවාද ලබමු. වැඩිහිටියන් ගෙන් අවවාද නොලබන නවක භික්ෂූන් පිරිහෙන බව ධර්මයෙහි සඳහන් වේ. එ කල එතරම් අගයක් නොදැනුණු එකී අනුශාසනාවල මොන තරම් වටිනාකමක් තිබේ ද යන්න දැන් අපට මනා ව පසක් වේ. උන් වහන්සේ මොන තරම් කරුණා සිතකින් ඒ දේ කරන්නට ඇද්ද යන්න දැන් අපට වැටහේ.

''මේ ධර්මායතනය ආරම්භ කරලා තියෙන්නේ හොඳ භික්ෂු පිරිසක් හදාගන්න. ඔය නමලාට තමයි මේ ශාසනය රැකීමේ උරුමය හිමි වන්නේ. දැන් ඉඳලා ම

මේ හොඳ නමලා ඒකට සුදුසු වෙන්න ඕනෑ. නිකම් ම නොවේ. ඒ සඳහා පාලි භාෂාවත් පෙළ - අටුවා සහිත ධර්මයත් හොඳට ඉගෙන ගන්න ඕනෑ.''

''මම දැක්කා මහානායක මාහිමියන් වහන්සේ එක නමක ගේ සමරු පොතක ලියලා තියෙනවා ''මහණකම හොඳින් කළොත් නිවන - මහණකම වරදවා කළොත් නිරය'' කියලා. හරිම වටිනා රන් වැකියක් නේ ඒක'' සමහර අයට ඕවා ගාණක් වත් නැහැ නේ .

''වත් පිළිවෙත්" කිරීම මහණ කමට අයිති දෙයක්. කවුරුත් එකතු වෙලා වත් පිළිවෙත් කළාම කොච්චර හොඳ ද ? ''වත්තං න පරිපූරෙන්තො- න සීලං පරිපූරති'' වත් පුරන්නේ නැත් නම් කොහොම ද සීලය සම්පූර්ණ වෙන්නෙ. ඒ හින්ද ඔය නමලා කම්මැළි වෙලා නිකං ලෙඩ්ඩු වෙන්න කලින් තමතමන්ට අයිති වතාවත් හොඳට හොයලා බලල කරන්න ඕන. මඟ අරින්න හොඳ නැහැ. පිණ්ඩපාත චාරිකා වත මහ රහතන් වහන්සේලා පවා වර්ණනා කරපු දෙයක්. මම කකුල් දෙකේ පණ තියෙනකම්ම පිණ්ඩපාතෙ යන්න තමයි කැමැත්ත.''

ඒ කී ලෙසින් ම ලොකු හාමුදුරුවන් වහන්සේ පිණ්ඩපාතේ වඩින්න මහත් රුචියක් දැක්වූහ. ''පිණ්ඩපාතේ යෑම මහණ කමට අයිති වතක්. උපසම්පදා වන කොට හැම දෙනාට ම මතක් කරන 'පිණ්ඩපාතය නිසයි මේ පැවිද්ද. එහෙයින් එහිලා ඔබ දිවි හිමියෙන් උත්සාහවත් විය යුතු යි'' කියන එක

නො සලකන එක හොඳ නැහැනේ. ඉස්සර හික්කඩුවේ නායක හාමුදුරුවෝ පවා හැතැප්ම ගණන් පිණ්ඩපාතේ වැඩියා නේ ? බලන්න දුප්පත් කී දෙනෙකුට නම් එයින් දානේ හැන්දක් හරි බෙදන්න ලැබෙනවා ද? මහරගම පමණක් නොව, උණුවතුර බුබුළ, බෝවලවත්ත, අඹකොටේ, මාතලේ, පේරාදෙණිය, මහනුවර ආදි ප්‍රදේශවල දුප්පත් මහ ජනතාව ද ලොකු හාමුදුරුවන් වහන්සේට පිණ්ඩපාතේ ටිකක් බෙදන්නට ලැබීම පිළිබඳ ව සොම්නසින් කතා කළ අයුරු දැනුදු සිහිපත් වේ.

''එක වහලේ යට ඉන්නා අපේ නමලා හැම දෙනා ම එක පවුලේ වගේ සමගියෙන් ඉන්න ඕනැ. අර චූලගෝසිංග සූත්‍රයෙහි සඳහන් කරල තියෙන විදියට ''සමග්ගා, සම්මෝදමානා, අවිවදමානා, ඛීරෝදකීභූතා, අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා .....'' බලන්න මොන තරම් ලස්සන ද බුදු බණ පද. අර අනුරුද්ධ, භගු, කිම්බිල හාමුදුරුවරු තුන් නම ම බුදුහාමුදුරුවන්ට වෙන වෙන ම කියනවනේ, ස්වාමීනි, අපි තුන් නම ම කයින් තුන් දෙනෙක් වුණාට සිතින් එක නම යි කියලා. නියම බුද්ධපුත්‍රයො නම් එහෙම තමයි.''

ලොකු හාමුදුරුවන් වහන්සේට නේවාසික සියලු භික්ෂූන් ගැන ම අවධානය තිබිණි. බුද්ධ වන්දනාවට කවුරුන් හෝ නො පැමිණියොත් උන් වහන්සේ කැඳවා ප්‍රශ්න කරති. උන් වහන්සේ ශිෂ්‍ය භික්ෂූන් සමග ම බුදුන් වඳිති. සමහර දිනෙක බුදුන් වඳින ශාලාවේ අසල පැසේජයෙහි සක්මන් කරති. දාන ශාලාවේ නැති භික්ෂූහු ද ලොකු හාමුදුරුවනට සටහන් වෙති. දාන ශාලාවෙහි

කතා කරන, වට පිට බලමින් දාන වළඳන භික්ෂූන්ට ලොකු සමිඳුන් ගේ ඍජු බැල්ම ම ප්‍රමාණවත් ය. එ පමණකින් ඔවුනට වරද තේරුම් ගත හැකි වෙයි. ශිෂ්‍ය පුත්‍රයන් වහන්සේලා හදා ගැනීම සඳහා උන් වහන්සේ කවර තරමේ මානසික අපහසුතාවක් වේදනාවක් ලබන්නට ඇද්දැයි දැන් අපට සිතේ.

''පොඩි නමලා, මොළේ තියෙන අය පහදින්නේ ශ්‍රමණ ආකල්පවලටට. බලන්න මිනිස්සු නොකා, නොබී, සලකන්නේ ඒ නිසා. කතා කරන කොට, ඉරියවු පවත්වන කොට ඒවා සංවරයෙන් කිරීම තමයි. දානය වළඳන කොට වුණත් ආචාරශීලි ව ඒක කරන්න ඕන. එතකොට තමයි දායකයන්ගේ ශ්‍රද්ධාව, ප්‍රසාදය වැඩි වෙන්නේ, ''අප්පසන්නානං වා පසාදාය, පසන්නානං වා භියෝභාවාය'' නොපැහැදුණු අයගේ පැහැදීම සඳහා පැහැදුණු අයගේ පැහැදීම වැඩි දියුණු වීම සඳහා අප හැසිරෙන්නට ඕනෑ. ඒක බොරුවෙන් වංචාවෙන් කරන පැහැදවීමක් නොවිය යුතු යි.''

''මේ නමලා උදේ හවස දසධම්ම සූත්‍රය අර්ථ වශයෙන් මෙනෙහි කරමින් සජ්ඣායනා කළ යුතු යි. ඒකෙ තියෙන කාරණා දහය නිතර නිතර මෙනෙහි කරන්න කියලයි පෙන්වල තියෙන්නෙ.'' කොහොම ද මම අද දහවල් කාලය ගත කෙළේ, රාත්‍රී කාලය ගෙවුණේ කොහොම ද? එහෙම හිතා බලන්න ඔය සූත්‍රය උගන්වනව නේ? කොච්චර උතුම් ද බලන්න ඒ අවවාද. අර මඛාදේව සූත්‍රයේ දේශනා කරලා තියෙනවනේ, ඔය නමලා මේ ශාසනයේ අන්තිම පුරුෂයන් වෙන්න එපා යි

කියලා. අනාගත ශාසනය වෙනුවෙන් ඔය නමලා මේව හොඳට මතක තියාගෙන හැඩගැහෙන්න ඕනැ.''

තම ශිෂ්‍යයන් වහන්සේලා භාවනා මාර්ගයට යොමු කරවීමට ලොකු හාමුරුවන් වහන්සේ නිතර අවධාරණය කළේ තමන් වහන්සේ ද එය ආදර්ශයෙන් පෙන්වා දෙමිනි. ශ්‍රමණ ධර්මය නම් සමථ විදර්ශනා වැඩීම බව උන් වහන්සේ නිතර සිහිපත් කළහ. බොහෝ දුක් වෙහෙස දරමින් අරණ්‍ය සෙනසුන් කිහිපයක් උන් වහන්සේ විසින් නිර්මාණය කරන ලද්දේ අනාගතයෙහි වුව ද සසුනට පිවිසෙන පැවිද්දනට යොගාවචර ජීවිතයක අගය පහදා දෙනු සඳහා ය.

ඉහත කී අයුරින් මෙ බඳු අවවාද සිය දහස් ගණනින් ලබන්නට අපි වාසනාවන්ත වීමු. විටෙක ගලකටත් වඩා දැඩි සිතින් ද, විටෙක මලකටත් වඩා මොළොක් කරුණාවන්ත භාවයකින් ද දිවියෙන් වැඩි කාලයක් මුළුල්ලේ සසුන රැක ගැන්මේ පිවිතුරු සිතින් කළ මෙහෙවර සදාභිවන්දනීය වන්නේ ම ය.

අපේ ලොකු හාමුදුරුවන් වහන්සේ කාලය අපතේ නො යවා කාලයෙන් වැඩ ගත් උතුමාණ කෙනෙකි. පිරිසිදු කම ඉතා ඉහළින් උන් වහන්සේ අපේක්ෂා කළහ. උන් වහන්සේ වැඩ වුසූ කුටියේ මාස 2-3 කට වතාවක් පොත් අල්මාරිවල ස්ථාන මාරු කිරීමට සිදු වේ. දහවල් සැතපීමක් උන් වහන්සේට නො වී ය. ඒ කාලයෙහි උන් වහන්සේ පන්සල් වත්තේ සක්මන් කරති. වැටුණු කොළ අහුලා ගස්වලට ම පොහොර පිණිස යොදති.

කැපකරුවකු අල්වා ගෙන කළ යුතු යමක් පහදා දෙති. එසේත් නැත් නම් වාසය කරන කුටියේ එළියේ දොරටුව ළඟ තිබෙන පුටුවෙහි වැඩ හිඳ ත්‍රිපිටක පොතක් හෝ අටුවා පොතක් කියවති. ඉතා වැදගත් තැනක් අසු වුව හොත් පෑනෙන් ඉරි ගසා නැවතත් කියවන්නට සලසා ගනිති. '' මේ බලන්න..... සැරියුත් හාමුදුරුවෝ අසත්පුරුෂයන් එක්ක එක සක්වළකවත් ඉන්න නො ලැබේවා කියලා ප්‍රාර්ථනා කරලා තියෙන හැටි'' ආදි වශයෙන් පවසමින් උද්ධෘත පාඨ ශිෂ්‍යයනට ද පෙන්වති. ''මං මේවා ඉරි ගහල තියෙන්නේ ඔය නමලට පස්සේ පැහැදිලි ව බලාගන්න''.

අම්පිටියේ ලොකු හාමුදුරුවන් වහන්සේ අප සැමට විනය පිළිබඳ ව, ශික්ෂා ගරුත්වය පිළිබඳ ව නිදර්ශනය වූහ. ආකල්ප සම්පත්තිය පිළිබඳ ව, පැවිදි ආචාර සමාචාර පිළිබඳ ව අප බොහෝ දෙවල් ඉගෙන ගත්තේ උන් වහන්සේ වෙතිනි. සේඛියා සිකපදවල ඉගැන්වූ ශික්ෂා මාර්ගයට නිදසුන් ලැබුණේ උන් වහන්සේ ගෙනි. 'ආචරණාත් ආචාර්යඃ' යැයි පැරැණි භාරතීය සාම්ප්‍රදායික කියමනක් ඇත. සුදුසු ආචාර්යවරයකු වන්නේ නිවැරැදි හැසිරීම කරණ කොට ගෙන ය. නැත් නම් හේ ඇදුරෙක් නොවේ. ලොකු හාමුදුරුවන් වහන්සේ තුළ ඒ මහරු ගුණ නොමඳ ව රැඳී තිබිණි.

ලාභ - සත්කාර- කීර්ති -ප්‍රශංසාවලට ගිජු නොවී වාසය කිරීමට උන් වහන්සේ සංයුත්ත නිකායයේ ලාභසක්කාර සංයුත්තයේ සඳහන් කරුණු නිතර නිතර සිහිපත් කරවූහ. '' මහණෙනි, ලාභ -සත්කාර කීර්ති -

ප්‍රශංසා දරුණු යි, නපුරු යි, රළු යි, පරුෂ යි, උතුම් නිවනට අන්තරාය යි. ඒ නිසා ලාභ සත්කාරවලට ගිජු නොවන්නට, ඒවා අතහැර දමන්නට, ඒවායෙන් විනාශ නොවන්නට බුදුරජාණන් වහන්සේ දුන් උපදේශය මොන තරම් වටිනවා ද?''

ලොකු හාමුදුරුවො බොහෝ අසූ පිරූ තැන් ඇති කෙනෙකි. ඉංගිරිසි බස පිළිබඳ ව ද මනා දැනුමක් උන් වහන්සේ ට තිබිණි. සුදුසු ධර්මදූතයන් වහන්සේලා හිඟ එකල, පිටරටවල ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා බොහෝ ආරාධනා ලැබිණි. ඒවා එක් වරම උන් වහන්සේ ප්‍රතික්ෂෙප කළහ. ''මං මහණ වුණේ රට රටවල ඇවිදින්න නෙමේ. මහණ කම රැකගෙන ලංකාවෙ ඉන්නයි මම කැමති.''

## දහමින් සමාජයට ලබාදුන් ජීවිතාලෝකය

පැවිදි ශිෂ්‍යයන් ගේ මතු නොව, ගිහි ජනතාවගේ ජීවිත ධර්මානුකූල ව හැඩගැස්වීමට ද උන් වහන්සේ අපමණ වෙහෙස වූහ. ප්‍රසාදනීය ධර්මකථිකයකු වූ අම්පිටියේ ලොකු හාමුදුරුවන් වහන්සේ, තමන් දේශනා කරන දහම මහජනයා ගේ සිත්වලට කාවැදෙන අයුරින්, ඒවා ජීවිතයට පුරුදු කළ හැකි අයුරින් රසවත් ව පැහැදිලි කිරීමට සමත් වූහ. ''නියම ධර්මකථිකයකු නම් අසන මහජනතාවට දුක පිළිබඳ වූ යථාර්ථය ඒත්තු ගන්වන්න ඕනැ. ශ්‍රාවක පිරිස ශ්‍රද්ධාවෙහි මැනැවින් තහවුරු කරන්න ඕනැ.'' ජීවන මංසලෙහි විවිධ දුක් කම්කටොලු හැල හැප්පීම්වලට මැදිව වාසය කරන

විවිධ තරාතිරම්වල ජනයාට උන් වහන්සේ දෙසූ බණ පද මහත් අස්වැසිල්ලක් ලබා දුන්නේ ය. කුඩා දරුවනට ද ඒ දෙසුම් ඉතා ප්‍රිය විය. සරල ලෙස සුගම ලෙස ශ්‍රෝතෘ ජනයාට ප්‍රිය උපදවන ලෙස උන් වහන්සේ පැවැත්වූ දහම් දෙසුම්වල ඇතැම් විට අහිංසක හාස්‍ය රසය ද මතු වී ය.

එ කල වසර ගණනාවක් උන් වහන්සේ මහරගම ගුරු විද්‍යාලයේ පුහුණු වන ගුරුවනට බුද්ධ ධර්මය විෂය ඉගැන්වූයේ නිස්සරණාධ්‍යාශයෙනි, ස්වේච්ඡාවෙනි. අද සේවා විශ්‍රාම ලබා සිටින, එකල පුහුණුව ලැබූ එම ගුරුවරුන් ගුරුවරියන් අදත් මහත් සතුටින් ප්‍රකාශ කරන්නේ තමන් ලොකු සමිඳුන් ගෙන් පොතින්, සටහන්වලින් දහම ඉගෙන ගත්තාට වඩා දහමින් ජීවිතය ඉගෙන ගත් බව ය. ගුරු පරපුර යහමඟ ගමන් කළොත් සිසු පරපුර ද යහපත් වන බවත් උන් වහන්සේ තරයේ විශ්වාස කළහ. මෙ ලෙසින් මේ රටේ භික්ෂූන් වහන්සේලා ධර්ම විනයධර ව හදාගත්තොත් සසුනත් රටත් දෙක ම රැකගත හැකි බව ද උන් වහන්සේ අවධාරණය කළහ.

අම්පිටියේ ශ්‍රී රාහුල ලොකු හාමුදුරුවන් ගේ නොසිස් අපිස් ගුණයෙන් ඔපවත් වූ උතුම් පැවිදි දිවියෙන් සම්බුද්ධ ශාසනයටත් ගිහි-පැවිදි සමාජයටත් සිදු කරන ලද මහරු මහ මෙහෙයට ගෞරවෝපහාර වශයෙන් අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහානිකායයේ අතිපූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ අනුදැන්මෙන් හා නිකායයේ උත්තර - අධිකරණ - කාරක යන

මණ්ඩලත්‍රයයේ අභිමතයෙන් උන් වහන්සේට ''ශ්‍රී ධර්මරක්ෂිත වංශාලංකාර මහෝපාධ්‍යාය'' යන ගෞරව නාමය සහිත ව උත්තර මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය පිරිනමන ලදි. එම උසස් පදවියට නායක ධුරයක් ද ව්‍යවස්ථානුකූල ව හිමි ය. එසේ වුව ද''අම්පිටියේ ශ්‍රී රාහුළ නායක ස්වාමීන්ද්‍රයන්ට'' වඩා ''අපේ අම්පිටියේ ලොකු හාමුදුරුවෝ'' යන ව්‍යවහාරය එදාටත් වඩා අද අපට මහත් වූ හෘදයංගම භාවයක් දනවයි.

අපේ ලොකු හාමුදුරුවෝ මෙම දෙසැම්බර මස 24 දා 99 වන වියට පා තබති. ස්මරණය මඳින් මඳ ලිහිල් වුව, වයෝවෘද්ධ ව, ''ධර්මායතනයක්'' නිර්මාණය කළ මහරගම කුටියෙහි ම පතිසල්ලීන ව වැඩ සිටිති. එදා ගුරුදේවයන් වහන්සේට මහත් ගුරු භක්තියෙන් සිදු කළ උපස්ථානවල දිට්ඨධම්මික කුශල විපාකය උන් වහන්සේ දැන් අත්විඳින්නා සේ ය. පූජ්‍ය මැණික්බෝවේ දීපාලෝක ශිෂ්‍යපුත්‍රයන් වහන්සේ ගේ ආදර - ගෞරව සම්ප්‍රයුක්ත උපස්ථානය ලබමින්, වියපත් වුව ද සුවපත් අධ්‍යාත්ම ශක්තියෙන් සුපසන් ව උන් වහන්සේ වැඩ හිඳිති.

ශ්‍රී ලංකාවේ, අග්‍රගණ්‍ය පාණ්ඩිත්‍යයෙකින් ප්‍රතිමණ්ඩිත වැ වැඩ විසූ අභිධජ මහා රට්ඨගුරු අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක මාහිමිපාණන් වහන්සේත් අප ගුරුදේවයන් වහන්සේලාත් අතර පැවතුණේ සම්භක්ත කල්‍යාණමිත්‍රත්වයෙකි. අන්‍යෝන්‍ය සගාරවතාවෙකි. අප ලොකු හාමුදුරුවන් වහන්සේ

පිළිබඳ ව උන් වහන්සේ කළ අපදාන සටහනකින් මෙම මාහැඟි චරිතාභිනන්දනය අවසන් කරනු කැමැත්තෙමි.

''බුහුසු බව ද, කථික බව ද, ගත් රසයු බව ද යන මේ කිසිවකිනුත් නොමඟට නො වැටී, එළැඹැ සිටි සිහියෙන් තමන් ගත් මඟින් මැ නිහඬ වැ යන ටික දෙකනුන් පැවිදි තැන් අතුරෙහි උස් තැනෙකැ සිටි කෙනෙක් වෙති. ගිහි පැවිදි වැඩි දෙනා පෙරළාගෙන හමන ධර්මප්‍රතිරූපක අධර්ම චණ්ඩ මාරුතයට ඔබ මුහුණ පා කෙළින් සිටිති. තම ගත් මඟින් නො ඉවත් වැ, නොවක් වැ, හැබෑ සැටියෙන් මැ යශස් නො පතා, ලාභ නො පතා, ශ්‍රාමණ්‍යය මැ ඉලක්ක කොට ගෙනැ මහණ දම් පුරති. සිල් රකිති, විවසුන් වඩති. මේ කවුරු ද? අම්පිටියේ රාහුල මහ තෙරණුවෝ ය.''

(සම්භාවනා - vii පිටුව)

උතුම් තෙරුවන් බෙලෙන් අපේ ගුරු දෙවි අම්පිටියේ ලොකු හාමුදුරුවන් වහන්සේ නිදුක් වෙත් වා ! නීරෝගී වෙත් වා ! සුවපත් වෙත් වා ! යන ආසී කුසුම උන් වහන්සේ ගේ පින්සරු පා මුල තබමින් මේ ගුරු ගුණ සමර නිමහම් කරමි.

**– බෞද්ධ ළමයා සංස්කාරක**